අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා පමණි.

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## තනතුරු ඇබෑර්තු 2025

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් අනධ්‍යයන තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් 2025.11.14 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) III ශ්‍රේණිය

- **සුදුසුකම් :**

1. අ.පො.ස. (සා/පෙළ) විභාගය එක් වරක දී පහත සඳහන් විෂයයන් සඳහා සම්මාන සාමර්ථ්‍යයන් සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.
   i. සිංහල භාෂාව/දෙමළ භාෂාව
   ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය
   iii. ගණිතය

සහ

2. අ.පො.ස. (උ/පෙළ) විභාගය එක් වරක දී විෂයයන් තුන ම (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබිය යුතු ය.

**පහත සඳහන් සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.**

අ). පිළිගත් ආයතනයකින් පරිගණක යෙදවුම් සම්බන්ධයෙන් මාස හයකට (06) නොඅඩු කාලසීමාවක් සඳහා ලබා ගන්නා ලද පිළිගත හැකි සුදුසුකමක් ලබා තිබීම.

සහ

ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද ලබා තිබීම.

**<u>තනතුරට විශේෂ වූ සුදුසුකම්</u>**

ඉහතින් දක්වා ඇති සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) තනතුරට විශේෂ වූ සුදුසුකම් සපුරාලිය යුතුය.

- ගබඩා පරිපාලනය පිළිබඳ වසරක පළපුරුද්ද සහ/හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී වාණිජ්‍ය විෂය සමත්ව තිබීම හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ගණකාධිකරණය විෂය සමත්ව තිබීම.

- **තේරීම** : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්
- **වැටුප් ක්‍රමය හා වැටුප් පරිමාණය :** UMN 1(III), - රු. 49,475-17×540 – 58,655 (මාසික) (මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**සටහන :**

a. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
b. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.
c. මනා චරිතයක් තිබිය යුතු ය.

- තෝරා ගනු ලබන අය විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන පරිදි ආරක්ෂක තැන්පතුවක් තැබිය යුතු ය.

වැඩි විස්තර සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 12/2018 බලන්න.

අයදුම්පත් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.bpu.ac.lk) බාගත (download) කළ යුතු අතර නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග සුදුසුකම් දැක්වෙන අදාළ සහතිකවල හා පළපුරුද්ද ඇතුළත් සහතික වල සහතික කළ ඡායා පිටපත් ද සහිත ව ලිපි කවරයක බහා එහි ඉහළ වම් කෙළවරෙහි තමන් විසින් අයදුම් කරනු ලබන තනතුර පැහැදිලි ව සඳහන් කර අංශ ප්‍රධාන මඟින් මා වෙත 2025.11.14 දින හෝ එදිනට පෙර එවිය යුතුය.

ඉහත සඳහන් කළ අවශ්‍යතාවන්ට අනුගත නොවූ, අසම්පූර්ණ, අපැහැදිලි හෝ පමා වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී**
**2025.10.27**